මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව -** මාලිම්බඩ
**மாலிம்பட பிரதேச சபை - மாலிம்பட**
**MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA**

දිනය :- 2022.03.01
திகதி :-
Date :-

දු.ක./ෆැක්ස් **தொலைபேசி**/ **தொலைநகல்** Telephone / Fax:- 041-2240208

---

**<u>මාලිම්බඩ ප්‍රාදේශීය සභාව</u>**

**<u>2022.02.08 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව</u>**

සහභාගීත්වය :-
ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා

**නොපැමිණීම** ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 පෙබරවාරි මස මාසික සභා රැස්වීම 2022.02.08 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

***01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.***

2022.01.11 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව 2022.01.11 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

***02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන***

***03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.***

- පාලටුව, මාලිම්බඩ, ශ්‍රී ඉන්ද්‍රාරාම පන්සල පාර, ඩී.ජී.ඩබ්.එස්.අනුරුද්ධ යන අය විසින් එවා තිබූ "ජල සම්පාදන මණ්ඩලය විසින් ජලය ලබා ගැනීම සම්බන්ධවයි." යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- තෙලිජ්ජවිල, මැදිවිදුහල් මාවත, තෙලිජ්ජවිල, පී.ආර්.කලුආරච්චි යන අය විසින් එවා තිබූ "මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් මාගේ ඉඩම් කොටසකම අයිතිය ගෙනහැර පෑම" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති "රාජ්‍ය නිලධරයන්ට සහ විශ්‍රාමිකයින්ට රු. 5000.00ක මාසික දීමනාවක් ලබා දීම." යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

***04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත***

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

**<u>යෝජනා අංක 5:1</u>**

2021/12/23 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:1</u>**

2021/12/23 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:2</u>**

2021/12/31 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:2</u>**

2021/12/31 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:3</u>**

පළාත් පාලන ආයතනයන්ගේ සංසදය සඳහා වාර්ෂිකව ගෙවිය යුතු රු. 7500 ක මුදල 2022 වර්ෂය සඳහා ගෙවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:3</u>**

පළාත් පාලන ආයතනයන්ගේ සංසදය සඳහා වාර්ෂිකව ගෙවිය යුතු රු. 7500 ක මුදල 2022 වර්ෂය සඳහා ගෙවීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:4</u>**

2022 වර්ෂයට මාලිම්බඩ ප්‍රාදේශිය සභාව සඳහා ගස් කැපුම්කරුවෙකු සහ මිනින්දෝරුවරයෙකු ලියාපදිංචි කර ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:4</u>**

ගස් කැපුම්කරුවකු ලියාපදිංචි කිරීමේ ගාස්තු ලෙස රු. 100.00ක්ද මිනින්දෝරුවකු ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 500.00ක්ද වශයෙන් අයකර ලියාපදිංචි කර ගැනීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:5</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභා ශ්‍රවණාගාරය සඳහා ශබ්ද විකාශන පද්ධතියක් සවි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:5</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභා ශ්‍රවණාගාරය සඳහා ශබ්ද විකාශන පද්ධතියක් සවි කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:6</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ සභා ගර්භය සඳහා විධායක පුටු 17ක් මිල දී ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

යෝජනාව ඉල්ලා අස්කරගන්නා ලදී.

**<u>යෝජනා අංක 5:7</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභාගත කිරීම සුදුසු බවටත් එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ලබන සභා වාරයට කල් දමන ලදී.

**<u>යෝජනා අංක 5:8</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාව වෙනුවෙන් සකස් කරන ලද වෙබ් අඩවිය හරහා මාර්ගගත ගෙවීම් (Online Payment) පහසුකම සැලසීම සුදුසු බවටත් ඒ සඳහා සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව අනුමත කිරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ලබන සභා වාරයට කල් දමන ලදී.

**<u>යෝජනා අංක 5:9</u>**

මාර්ගගත ගෙවීම් (Online Payment) පහසුකම මගින් ලැබෙන මුදල් ගිණුම්ගත කිරීම සඳහා මාලිම්බඩ ලංකා බැංකුවේ නව ගිණුමක් ආරම්භ කිරීම සුදුසු බවටත් එහි චෙක්පත් වල පළමු අත්සන්කරු ලෙස ලේකම් එච්.එච් අසංකා කුමාරි මිය හා දෙවන අත්සන්කරු ලෙස ජී.එච් පූර්ණිමා ප්‍රියදර්ශණී මෙනවිය පිළිගැනීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ලබන සභා වාරයට කල් දමන ලදී.

**<u>යෝජනා අංක 5:10</u>**

මාලිම්බඩ ලංකා බැංකුවේ ආරම්භ කිරීමට නියමිත මාලිම්බඩ ප්‍රාදේශිය සභා පොදු ගිණුම සඳහා චෙක්පත්වල පළමු අත්සන්කරු ලෙස ලේකම් එච්.එච් අසංකා කුමාරි මිය හා දෙවන අත්සන්කරු ලෙස ජී.එච් පූර්ණිමා ප්‍රියදර්ශණී මෙනවිය පිළිගැනීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:10</u>**

මාලිම්බඩ ලංකා බැංකුවේ ආරම්භ කිරීමට නියමිත මාලිම්බඩ ප්‍රාදේශිය සභා පොදු ගිණුම සඳහා චෙක්පත්වල පළමු අත්සන්කරු ලෙස ලේකම් එච්.එච් අසංකා කුමාරි මිය හා දෙවන අත්සන්කරු ලෙස ජී.එච් පූර්ණිමා ප්‍රියදර්ශණී මෙනවිය පිළිගැනීම සුදුසු බවටත් තීරණය විය.

**<u>යෝජනා අංක 5:11</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ කොන්ත්‍රාත්/දෛනික පදනම මත සේවය කරන පහත නම් සඳහන් සේවකයින්ගේ සේවා කාලය වසරකින් දීර්ඝ කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

- ඩබ්.ඒ.කේ සුහානි සෙව්වන්දි
- හෂිනි චාමිකා බෝගොඩ
- ආර්.ඒ.කේ කෞෂලා හිමාෂා
- චතුරිකා මධුමල්කි රත්නසේකර
- ඩබ්.ඩී මධූෂා කුමාරි

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:11</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ කොන්ත්‍රාත්/දෛනික පදනම මත සේවය කරන පහත නම් සඳහන් සේවකයින්ගේ සේවා කාලය වසරකින් දීර්ඝ කිරීම සුදුසු බවට තීරණය විය.

- ඩබ්.ඒ.කේ සුහානි සෙව්වන්දි
- හෂිනි චාමිකා බෝගොඩ

- ආර්.ඒ.කේ කෞෂලා හිමාෂා
- චතුරිකා මධුමල්කි රත්නසේකර
- ඩබ්.ඩී මධූෂා කුමාරි

**යෝජනා අංක 5:12**

**ප්‍රාදේශිය සභා රැස්වීම් කාර්ය පටිපාටියේ 11(5) අනුව 2021/12/14 වන දින පැවති මහා සභාවේ අංක 5.10 යෝජනාව පරිච්ඡින්න කිරීම සඳහා වූ පහත සඳහන් යෝජනාව මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපති විසින් ගරු උප සභාපති ,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අජිත් නාලක යන සභිකයින් හතර දෙනාගේ අත්සන් සහිතව ඉදිරිපත් කිරීම.**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු මාර්ග ඇතුළු පොදු යටිතල පහසුකම් හා සේවාවන් සඳහා මධ්‍යම රජය මගින් හා ප්‍රාදේශීය සභාව සතු අරමුදල් මගින් රුපියල් ලක්ෂ පන්දහසකට වඩා වැඩි ප්‍රමාණයක් වෙන් කර ඇත. මෙම ප්‍රතිපාදන මත කරන ලද පහත සඳහන් ඉදිකිරීම් හා සේවාවන් සම්බන්ධව ජනතාව දැනුවත් කරලීම සඳහාත්, ගරු පළාත් පාලන අමාත්‍යතුමාගේ හා ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් ජනතා අයිතියට පැවරීම සඳහාත්, පවත්වන උත්සව කටයුතු සඳහා රුපියල් තුන්ලක්ෂ පනස්දාහක පහත ඇස්තමේන්තුවට යටත්ව සභා අරමුදලින් වැය ගරු සභාවට යෝජනා කරන්නීය.

1. කාපට් මාර්ග ඉදිකිරීම
   - I. හොරගොඩ පාතෙගම මාර්ගය
   - II. කිරිමැටිමුල්ල තල්ගහ පෙදෙස මාර්ගය
   - III. කිරිමැටිමුල්ල අලස්වත්ත මාර්ගය
   - IV. සෙන්ට්‍රල් පාර්ක් ගැමුණු මාවත මාර්ගය
   - V. පරණවත්තහේන මාර්ගය
   - VI. දම්පැල්ල දෙහිගහමුල්ල මාර්ගය
   - VII. දම්පැල්ල පාතෙගම මාර්ගය
   - VIII. ගල්ඇන්දකුට්ටිය මාර්ගය
   - IX. කද්දුව බේරුව වෙල එරදුව මාර්ගය
   - X. සුල්තානාගොඩ පලේවිල මාර්ගය
   - XI. සුල්තානාගොඩ කැකිල්ල මාර්ගය
   - XII. කිරිමැටිමුල්ල අඹගහගොඩ මාර්ගය
   - XIII. ගුණසේකර මාවත
   - XIV. කද්දුව වල්පිට මාර්ගය
   - XV. මාලිම්බඩ ඉන්ද්‍රාරාම විහාරස්ථානය හරහා මාරගහහේන මාර්ගය
   - XVI. සමරසිංහාරාම විහාරස්ථාන මාර්ගය
   - XVII. බීරමුල්ල මාර්ගය
   - XVIII. ගාමිණී මාවත
   - XIX. වෙළඳගොඩ ලුණුගොඩ මාර්ගය
   - XX. කද්දුව වල්පිට හරහා තෙලිජ්ජවිල මාර්ගය
   - XXI. ගල්පමුණ බතලපිට්ටනිය මාර්ගය
   - XXII. දෝලියද්ද මාර්ගය
   - XXIII. පොල්පිටිය රංචගොඩ මාර්ගය
   - XXIV. නුගදූව කොස්ඉන්දුව මාර්ගය
   - XXV. සුල්තානාගොඩ පලේවිල ප්‍රධාන මාර්ගය
   - XXVI. සුල්තානාගොඩ කැකිල්ල ප්‍රධාන මාර්ගය
   - XXVII. අකුරුගොඩ මිත්‍රානන්ද වත්ත මාර්ගය
   - XXVIII. අකුරුගොඩ අයිරින් මහත්මියගේ නිවස අසලින් ආරම්භ වන මාර්ගය

XXIX. නාපේ හංදියේ සිට වෛබිනියාවත්ත මාර්ගය
XXX. හොරගොඩ බටහිර දෝලියද්ද මාර්ගය

2. මාර්ග කොන්ක්‍රීට් කිරීම් සහ කැටගල් ඇතිරීම
3. මාලිම්බඩ පොලේ ඉහල මාලය ඉදිකිරීම
4. ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම
5. මාලිම්බඩ, හොරගොඩ ක්‍රීඩාංගන ඉදිකිරීම
6. පුවක්දොල ජල ව්‍යාපෘති
7. මාර/අල්හුදා විද්‍යාලයේ ජල ව්‍යාපෘති
8. ආයුර්වේද සායන මධ්‍යස්ථානයට උපකරණ සැපයීම
9. මාලිම්බඩ වාහන අංගනය ඉදිකිරීම
10. තෙලිජ්ජවිල පොළ භූමිය තාප්පය ඉදිකිරීම
11. බල ප්‍රදේශයේ සියලුම මාර්ගවලට පානීය ජල සැපයුම ලබාදීමේ ආරම්භක උත්සවය

| | |
|---|---|
| **1. හොරගොඩ – පාතේගම කාපට් මාර්ගය විවෘත කිරීමේ උත්සවය සඳහා වියදම් සාරාංශය** | |
| වියදම් දරණු ලබන කාරණය | දළ ඇස්තමේන්තුව (රු.) |
| ✓ ප්‍රභූ වේදිකාව 20'×40' | 60,000.00 |
| **සංග්‍රහ වියදම්** | |
| ✓ කැවුම් 250×30 | 7,500.00 |
| ✓ කොකිස් 250 ×15 | 3,750.00 |
| ✓ වැලිතලප 250×30 | 7,500.00 |
| ✓ හැලප 250 ×20 | 5,000.00 |
| ✓ කේක් කිලෝ 5 ×800 | 4,000.00 |
| ✓ කෙසෙල් කිලෝ 18.5 ×100 | 1,850.00 |
| ✓ ශබ්ද විකාශණ යන්ත්‍ර | 35,000.00 |
| ✓ සැරසිලි (කොඩිකණු) | 5,000.00 |
| ✓ ප්‍රචාරක කටයුතු - පොස්ටර් 12500.00 | 12,500.00 |
| ✓ ආරාධනා පත්‍ර මුද්‍රණය | 3,000.00 |
| ✓ VIP පුටු 300 ×10 | 3,000.00 |
| **එකතුව** | **148,100.00** |
| **2. මාලිම්බඩ පොළ ගොඩනැගිල්ල හා ගල්ඇන්දකුට්ටිය දෙමහල් ප්‍රජා ශාලා ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය සඳහා වියදම් සාරාංශය** | |
| ✓ වේදිකාව | 30,000.00 |
| **සංග්‍රහ වියදම්** | |
| ✓ කැවුම් 150×30 | 4,500.00 |
| ✓ කොකිස් 150 ×15 | 2,250.00 |
| ✓ වැලිතලප 150×30 | 4,500.00 |
| ✓ හැලප 150×15 | 2,250.00 |
| ✓ කෙසෙල් කිලෝ 4×100 | 400.00 |
| ✓ ශබ්ද විකාශණ යන්ත්‍ර | 35,000.00 |
| ✓ සැරසිලි (කොඩිකණු) | 5,000.00 |
| ✓ ප්‍රචාරක කටයුතු(බැනර්) | 12,500.00 |
| ✓ VIP පුටු 200×10 | 2,000.00 |
| ✓ ආරාධනා පත්‍ර මුද්‍රණ කටයුතු | 2,550.00 |
| **එකතුව** | **100950.00** |
| **3. සෙන්ට්‍රල් පාක් ගැමුණු මාවත විවෘත කිරීමේ උත්සවය සඳහා වියදම් සාරාංශය** | |
| ✓ වේදිකාව | 30,000.00 |
| **සංග්‍රහ වියදම්** | |
| ✓ කැවුම් 150×30 | 4,500.00 |
| ✓ කොකිස් 150 ×15 | 2,250.00 |
| ✓ වැලිතලප 150×30 | 4,500.00 |
| ✓ හැලප 150×15 | 2,250.00 |
| ✓ කෙසෙල් කිලෝ 4×100 | 400.00 |
| ✓ ශබ්ද විකාශණ යන්ත්‍ර | 35,000.00 |

| | |
|---|---|
| ✓ සැරසිලි (කොඩිකණු) | 5,000.00 |
| ✓ ප්‍රචාරක කටයුතු(බැනර්) | 12,500.00 |
| ✓ VIP පුටු 200×10 | 2,000.00 |
| ✓ ආරාධනා පත්‍ර මුද්‍රණ කටයුතු | 2,550.00 |
| **එකතුව** | **100950.00** |
| **මුළු එකතුව** | **350,000.00** |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

**ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා**

මේ යෝජනාව පහත ආකාරයට සංශෝධනය කිරීම සුදුසුයි කියලා යෝජනා කරනවා.

**සංශෝධිත යෝජනාව**

**යෝජනා අංක 5:12**

1. කාපට් මාර්ග ඉදිකිරීම
   - I. හොරගොඩ පාතෙගම මාර්ගය
   - II. කිරිමැටිමුල්ල තල්ගහ පෙදෙස මාර්ගය
   - III. කිරිමැටිමුල්ල අලස්වත්ත මාර්ගය
   - IV. සෙන්ට්‍රල් පාර්ක් ගැමුණු මාවත මාර්ගය
   - V. පරණවත්තහේන මාර්ගය
   - VI. දම්පැල්ල දෙහිගහමුල්ල මාර්ගය
   - VII. දම්පැල්ල පාතෙගම මාර්ගය
   - VIII. ගල්ඇන්දකුට්ටිය මාර්ගය
   - IX. කද්දුව බේරුව වෙල එරදුව මාර්ගය
   - X. සුල්තානාගොඩ පලේවිල මාර්ගය
   - XI. සුල්තානාගොඩ කැකිල්ල මාර්ගය
   - XII. කිරිමැටිමුල්ල අඹගහගොඩ මාර්ගය
   - XIII. ගුණසේකර මාවත
   - XIV. කද්දුව වල්පිට මාර්ගය
   - XV. මාලිම්බඩ ඉන්ද්‍රාරාම විහාරස්ථානය හරහා මාරගහහේන මාර්ගය
   - XVI. සමරසිංහාරාම විහාරස්ථාන මාර්ගය
   - XVII. බීරමුල්ල මාර්ගය
   - XVIII. ගාමිණී මාවත
   - XIX. වෙළදගොඩ ලුණුගොඩ මාර්ගය
   - XX. කද්දුව වල්පිට හරහා තෙලිජ්ජවිල මාර්ගය
   - XXI. ගල්පමුණ බතලපිට්ටනිය මාර්ගය
   - XXII. දෝලියද්ද මාර්ගය
   - XXIII. පොල්පිටිය රංචගොඩ මාර්ගය
   - XXIV. නුගදුව කොස්ඉන්දුව මාර්ගය
   - XXV. සුල්තානාගොඩ පලේවිල ප්‍රධාන මාර්ගය
   - XXVI. සුල්තානාගොඩ කැකිල්ල ප්‍රධාන මාර්ගය
   - XXVII. අකුරුගොඩ මිත්‍රානන්ද වත්ත මාර්ගය
   - XXVIII. අකුරුගොඩ අයිරින් මහත්මියගේ නිවස අසලින් ආරම්භ වන මාර්ගය
   - XXIX. නාපේ හංදියේ සිට වෛකීනියාවත්ත මාර්ගය
   - XXX. හොරගොඩ බටහිර දෝලියද්ද මාර්ගය
2. මාර්ග කොන්ක්‍රීට් කිරීම් සහ කැටගල් ඇතිරීම
3. මාලිම්බඩ පොලේ ඉහල මාලය ඉදිකිරීම

4. ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම
5. මාලිම්බඩ, හොරගොඩ ක්‍රීඩාංගන ඉදිකිරීම
6. පුවක්දොල ජල ව්‍යාපෘති
7. මාර/අල්හුදා විද්‍යාලයේ ජල ව්‍යාපෘති
8. ආයුර්වේද සායන මධ්‍යස්ථානයට උපකරණ සැපයීම
9. මාලිම්බඩ වාහන අංගනය ඉදිකිරීම
10. තෙලිජ්ජවිල පොළ භූමිය තාප්පය ඉදිකිරීම
11. බල ප්‍රදේශයේ සියලුම මාර්ගවලට පානීය ජල සැපයුම ලබාදීමේ ආරම්භක උත්සවය

ඉහත සඳහන් සංවර්ධන කටයුතු කොට්ඨාස දහයට අදාලව ක්‍රියාත්මක වන බැවින් එක් කොට්ඨාසයකට එක් උත්සවයක් පැවැත්වීම සඳහා වැය වන පහත සඳහන් වියදම් සභා අරමුදලින් දැරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

| වියදම් ශීර්ෂය | එක් කොට්ඨාසයකට වැය වන මුදල | කොට්ඨාස දහයට වැය වන මුදල |
|---|---|---|
| 20*30 වේදිකාව | 30000.00 | 300000.00 |
| ශබ්ධ විකාශන යන්ත්‍ර | 10000.00 | 100000.00 |
| ප්‍රචාරක කටයුතු (පෝස්ටර්, බැනර්) | 10000.00 | 100000.00 |
| | | 500000.00 |

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:12</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු මාර්ග ඇතුළු පොදු යටිතල පහසුකම් හා සේවාවන් සඳහා මධ්‍යම රජය මගින් හා ප්‍රාදේශීය සභාව සතු අරමුදල් මගින් රුපියල් ලක්ෂ පන්දහසකට වඩා වැඩි ප්‍රමාණයක් වෙන් කර ඇත. මෙම ප්‍රතිපාදන මත කරන ලද පහත සඳහන් ඉදිකිරීම් හා සේවාවන් සම්බන්ධව ජනතාව දැනුවත් කරලීම සඳහාත්, ගරු පළාත් පාලන අමාත්‍යතුමාගේ හා ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් ජනතා අයිතියට පැවරීම සඳහාත්, පවත්වන උත්සව කටයුතු සඳහා රුපියල් පන්ලක්ෂයක පහත ඇස්තමේන්තුවට යටත්ව සභා අරමුදලින් වැය කිරීමට තීරණය විය.

1. කාපට් මාර්ග ඉදිකිරීම
   I. හොරගොඩ පාතෙගම මාර්ගය
   II. කිරිමැටිමුල්ල තල්ගහ පෙදෙස මාර්ගය
   III. කිරිමැටිමුල්ල අලස්වත්ත මාර්ගය
   IV. සෙන්ට්‍රල් පාර්ක් ගැමුණු මාවත මාර්ගය
   V. පරණවත්තහේන මාර්ගය
   VI. දම්පැල්ල දෙහිගහමුල්ල මාර්ගය
   VII. දම්පැල්ල පාතෙගම මාර්ගය
   VIII. ගල්ඇන්දකුට්ටිය මාර්ගය
   IX. කද්දුව බේරුව වෙල එරදුව මාර්ගය
   X. සුල්තානාගොඩ පලේවිල මාර්ගය
   XI. සුල්තානාගොඩ කැකිල්ල මාර්ගය
   XII. කිරිමැටිමුල්ල අඹගහගොඩ මාර්ගය
   XIII. ගුණසේකර මාවත
   XIV. කද්දුව වල්පිට මාර්ගය
   XV. මාලිම්බඩ ඉන්ද්‍රාරාම විහාරස්ථානය හරහා මාරගහහේන මාර්ගය

XVI. සමරසිංහාරාම විහාරස්ථාන මාර්ගය
XVII. බීරමුල්ල මාර්ගය
XVIII. ගාමිණී මාවත
XIX. වෙළඳගොඩ ලුණුගොඩ මාර්ගය
XX. කද්දුව වල්පිට හරහා තෙලිජ්ජවිල මාර්ගය
XXI. ගල්පමුණ බතලපිට්ටනිය මාර්ගය
XXII. දෝලියද්ද මාර්ගය
XXIII. පොල්පිටිය රංචගොඩ මාර්ගය
XXIV. නුගදුව කොස්ඉන්දුව මාර්ගය
XXV. සුල්තානාගොඩ පලේවිල ප්‍රධාන මාර්ගය
XXVI. සුල්තානාගොඩ කැකිල්ල ප්‍රධාන මාර්ගය
XXVII. අකුරුගොඩ මිත්‍රානන්ද වත්ත මාර්ගය
XXVIII. අකුරුගොඩ අයිරින් මහත්මියගේ නිවස අසලින් ආරම්භ වන මාර්ගය
XXIX. නාපේ හංදියේ සිට වෛකීනියාවත්ත මාර්ගය
XXX. හොරගොඩ බටහිර දෝලියද්ද මාර්ගය

2. මාර්ග කොන්ක්‍රීට් කිරීම් සහ කැටගල් ඇතිරීම
3. මාලිම්බඩ පොලේ ඉහල මාලය ඉදිකිරීම
4. ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම
5. මාලිම්බඩ, හොරගොඩ ක්‍රීඩාංගන ඉදිකිරීම
6. පුවක්දොල ජල ව්‍යාපෘති
7. මාර/අල්හුදා විද්‍යාලයේ ජල ව්‍යාපෘති
8. ආයුර්වේද සායන මධ්‍යස්ථානයට උපකරණ සැපයීම
9. මාලිම්බඩ වාහන අංගනය ඉදිකිරීම
10. තෙලිජ්ජවිල පොළ භූමිය තාප්පය ඉදිකිරීම
11. බල ප්‍රදේශයේ සියලුම මාර්ගවලට පානීය ජල සැපයුම ලබාදීමේ ආරම්භක උත්සවය

ඉහත සඳහන් සංවර්ධන කටයුතු කොට්ඨාස දහයට අදාලව ක්‍රියාත්මක වන බැවින් එක් කොට්ඨාසයකට එක් උත්සවයක් පැවැත්වීම සඳහා වැය වන පහත සඳහන් වියදම් සහා අරමුදලින් දැරීමට තීරණය විය.

| වියදම් ශීර්ෂය | එක් කොට්ඨාසයකට වැය වන මුදල | කොට්ඨාස දහයට වැය වන මුදල |
|---|---|---|
| 20*30 වේදිකාව | 30000.00 | 300000.00 |
| ශබ්ධ විකාශන යන්ත්‍ර | 10000.00 | 100000.00 |
| ප්‍රචාරක කටයුතු (පෝස්ටර්, බැනර්) | 10000.00 | 100000.00 |
| | | 500000.00 |

**<u>යෝජනා අංක 5:13</u>**

ප්‍රාදේශිය සභාව සතු ප්‍රජා ශාලාවල පෙර පාසල් පවත්වාගෙන යාමේදී සභාවේ අනන්‍යතාවය ගිලිහෙමින් පවතින බැවින් ඒ සඳහා නිසි වැඩ පිළිවෙලක් සකස් කිරීමට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදයශාන්ත මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා

**ගරු මන්ත්‍රී ජී.පී උදයශාන්ත මහතා**
මම යෝජනාවක් හැටියට ඉදිරිපත් කරල තියෙන මේ ප්‍රජා ශාලාවල පෙර පාසල් පවත්වාගෙන යාමේදී සභාවේ අනන්‍යතාවය ගිලිහෙමින් පවතිනවා කියන යෝජනාව ඉදිරිපත් කළේ දැනට ප්‍රායෝගිකව මේ තත්ත්වය උද්ගතවෙලා තියෙන නිසයි.

ගරු සභාපතිතුමනි, හොරගොඩ ශ්‍රී වර්ධනාරාමයේ පෙර පාසලට, ප්‍රජා ශාලාවට, ඉඩම දෙන්නෙ පන්සලේ හාමුදුරුවෝ ඔප්පුවකින් ලියල සභාව ඒකෙ අයිතිය පවරනවා. ගරු මහින්ද ඇමතිතුමාගේ ප්‍රතිපාදන මත හදන අවස්ථාවේ ගොඩනැගිල්ල හදපු භූමිය රජය සතුයි කියලා නීතිමය තත්ත්වය අවශ්‍ය වුනා. ඒ වෙලාවේ ගරු කපිල ගමගේ සභාපතිතුමා දින 7ක් ඇතුලත ඔප්පු ලියන්න, ප්ලෑන් අදින්න, ගොඩනැගිල්ලෙ ප්ලෑන් එක අදින්න සභාවේ මුදල් වෙන් කරල ලොකු කාර්යය භාරයයක් ඉටු කරල දුන්නා.

එහෙම හදපු ප්‍රජා ශාලාව කොවිඩ් ගැටලුව ආපු වෙලාවෙ අපට එන්නත් කරණයට ලබා දෙන්න කියලා ගුරුවරියගෙන් ඉල්ලීමක් කළා. වැසිකිලියක් තිබුනෙ නෑ. ජලය තිබුනෙ නෑ. අපි මැදිහත්වෙලා වැසිකිලියක් හදල දීල ජලයත් ලබාදීල මොන්ටිසෝරිය තියාගන්න අවශ්‍ය පහසුකම් හදල දුන්නා. ඒ කාලේ හිටිය ගුරුවරිය දැන් නෑ. දැන් ඉන්නෙ අලුත් ගුරුවරියක්. එතුමිය දන්නෙ නෑ මේක කොහොම ආවද කියලවත් ගමේ, කොට්ඨාශයේ, මිනිස්සුන්ට එන්නත් ටික විදින්න තැනැක් නැතිව ඉන්නකොට අපි ඉල්ලීමක් කළා අපිට එතන ලබාදෙන්න කියලා. යතුර දෙන්නෙ නෑ ගෙදරට ගිහින් ඕන යතුර ගේන්න. කොට්ඨාශයේ මන්ත්‍රීතුමා ගෙදරට ගිහිල්ල තමයි යතුර ගෙනාවේ. බෙහෙත් විදල ඉවර වෙලා විෂබීජ හරණයත් කරල ගියාට පස්සෙ එතුමිය නැවත සභාපතිතුමාට කථා කරල තියෙනවා විෂබීජහරණය කරන්න කියලා. විෂබීජහරණය කළ බව නොදැන සභාවෙන් දෙවන වරටත් විෂබීජහරණය කරල තියෙනවා. තුන්වන වර බෙහෙත් විදින්න ගියාම එතුමිය අවස්ථාව දෙන්නෑ. පෙර පාසලේ ළමයින්ගේ දෙමව්පියන්ගෙන් අහන්නැතුව මේක දෙන්න බැහැ කියලා සභාවේ ගොඩනැගිල්ලක්, සභාවෙන් සියලු පහසුකම් දීල, සභාව මැදිහත් වෙලා හදල තියෙන්නෙ. අපිට පෙර පාසලේ ගුරුතුමියගේ පස්සෙන් යන්න වෙනවා යතුර ඉල්ලගන්න. ඒ වගේම තමයි හොරගොඩ ආදදොල ප්‍රජා ශාලාවේ වෙනත් කාන්තාවක් තමයි යතුර තියාගෙන ඉන්නෙ. ගමේ මිනිස්සුන්ට හදිසි රැස්වීමක්, සාකච්ඡාවක් තියාගන්න යතුර ගන්න විදියක් නෑ. ඒ නිසා මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා මේ වගේ පොදු ගොඩනැගිලිවල යතුරු සම්බන්ධව විධිමත් වැඩපිලිවෙලක් හදන්න. ගමේ විහාරස්ථානයේ එක යතුරක් තියන්න. ඒ වගේම සභාවේ එක යතුරක් තියන්න. ඒ වගේම එම ගොඩනැගිල්ලෙ යම් අලුත්වැඩියාවක් සංවර්ධන වැඩක් කරනවානම් සභාවේ අනුමැතිය අරගන්න. දැන් වෙලා තියෙන්නෙ එයාලා වෙන කාගෙන් හරි ප්‍රතිපාදනයක් වෙන් කරගෙන වැඩ කරගෙන ඒකෙ අයිතිය එයාලා ගන්නවා. සභාව දන්නෑ කරපු සංවර්ධන වැඩ මොනවද කියන එක. මම ඉල්ලීමක් කරනවා ලිඛිතව දැනුම්දීමක් කරන්න. සභාවේ අවසරයකින් තොරව කිසිදු වැඩකටයුත්තක් මින් ඉදිරියට කරන්න බෑ. ඒ වගේම කොට්ඨාශයේ මන්ත්‍රීවරයාට ගරු කරල වැඩකරන්න කියලා. ඒ නිසා විධිමත් වැඩපිලිවෙලක් හදල සභාවේ අනන්‍යතාවය රැකගන්න කියලා ඉල්ලනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා**
ඒ වගේම තමයි සමහර ප්‍රජා ශාලාවල් තියෙනවා පෙර පාසල් පවත්වන්න දුන්නම ඒ ගුරුතුමියන්ලා ඒ අයගේ බූදලයක් විදියට තමයි පාවිච්චි කරන්නෙ. හැබැයි කිසිම දේකට ප්‍රජා ශාලාව ගන්න අයිතියක් නෑ. සමහර පෙර පාසල්වල, අකුරුගොඩ නැගෙනහිර විජය ප්‍රජා ශාලාවෙ ලයිට්බිල ගෙවන්නෙ එතුමිය. අපි දන්නවා සමහර වෙලාවට පෙර පාසලක් පවත්වාගෙන යනකොට ප්‍රජා ශාලාවක් වෙනත් කටයුත්තකට දුන්නම පොඩි අපහසුතාවයකට පත්වෙනවා. පොඩි දරුවන්ගෙ ක්‍රියාකාරකම් වලට තියෙන පුටු, බංකු, ඒ සියලුම දේවල් වෙනස් වෙනවා. ඉතින් පොඩි අපහසුතාවයක් තියෙනවා. නමුත්, ඒ අයගේ පෞද්ගලික මුදලක් නෙමෙයි, සමහර වෙලාවට වහල කඩන් වැටුනත් වෙනත් ආපදා කටයුත්තක්

වුණොත් ඒවට සභාවේ මැදිහත්වීම බලාපොරොත්තු වෙනවා. නමුත් ප්‍රජා ශාලාවක් පවත්වාගෙන යන කිසිම කෙනෙක් සභාව විදියට අපි සියලු දේවල් දුන්නත් ඒකෙ ප්‍රතිලාභයක් පෙර පාසල් දරුවන්ට ලැබෙන්නෙ නෑ. පෙර පාසල් මුදල කීයද ඒ මුදල ඒ ආකාරයෙන්ම කිසිම අඩුවක් නැතිව ලබාගන්නවා. මේක හරිම අසාධාරණයක්. මැදගොඩ ප්‍රජා ශාලාවේ පෙර පාසලක් පවත්වාගෙන යනවා. අපි සියලුම පහසුකම් දීලා තියෙනවා. අපි ඒ පහසුකම් දෙනවා වගේම ඒ පහසුකම් ඒ දරුවන්ට ලැබෙන්න ඕන. ඒ නිසා මම පෞද්ගලිකව මැදිහත් වෙලා ඒ පහසුකම් ලබා දුන්නා. මේ ලබා දෙන ඒවගේ ප්‍රතිලාභ දරුවන්ට ලැබිය යුතුයි. සභාව යටතේ තිබෙන පෙර පාසල් වල කිසිම ප්‍රතිලාභයක් ඒ දරුවන්ට ලැබෙන්නෙ නෑ. මැදගොඩ ප්‍රජා ශාලාව තුල පවත්වාගෙන යන ඒ පෙර පාසල තුල ප්‍රජා මණ්ඩලය හරහා අධීක්ෂණ කටයුතු කරන්න කියල ඉල්ලනවා. මම ඔබතුමාගෙන් ඉල්ලන්නෙ සියලු ප්‍රජා ශාලාවල් අයිති ප්‍රජා මණ්ඩල වලට, ඒ නිසා මේ ප්‍රජා ශාලාවල් පවත්වාගෙන යාමට ප්‍රජා මණ්ඩල හරහා කටයුතු කරන්න. මේකෙ සම්පූර්ණ අයිතිය සභාව සතු කර ගන්න කියන ඉල්ලීම කරනවා.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:13</u>**

සභාව සතු සෑම ප්‍රජා ශාලාවකටම එය සභාව සතු දේපලක් බැවින් ප්‍රජා කටයුතු සඳහා ලබාදිය යුතු බවත්, විදුලිබිල් තමන් විසින් ගෙවා ගත යුතු බවත්, දැනුම් දීමට තීරණය විය.

6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.

**<u>යෝජනා අංක 6:1</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කෘෂි ඒකකය මගින් ක්‍රියාත්මක කරන "රසායනික ද්‍රව්‍ය වලින් තොර කාබනික පෝෂක මගින් නිවසට තිරසර ගෙවතු වගාවක්" ව්‍යාපෘතිය අනුමත කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

**<u>ගරු මන්ත්‍රී සාගර එදිරිසූරිය මහතා</u>**

සභාපතිතුමා අධීක්ෂණ මණ්ඩලයට තෙලිජ්ජවිල කෘෂි පර්යේෂණ ආයතනයේ නිලධාරීන් ඇතුලත් කරන්න.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:1</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කෘෂි ඒකකය මගින් ක්‍රියාත්මක කරන "රසායනික ද්‍රව්‍ය වලින් තොර කාබනික පෝෂක මගින් නිවසට තිරසර ගෙවතු වගාවක්" ව්‍යාපෘතිය අනුමත කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:2</u>**

ගැඩවිලි පොහොර දියර ව්‍යාපෘතිය අනුමත කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:2**
ගැඩවිලි පෙහොර දියර ව්‍යාපෘතිය අනුමත කිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:3**
අඩිපාරක්ව පැවැතුනු මාලිම්බඩ ඉන්ද්‍රාරාම මාරගහහේන මාර්ගයේ දකුණු පස මාර්ගය මේ වන විට අඩි 08 දක්වා පුළුල් කර කැටගල් ඇතිරීම සිදුකරගෙන යනු ලැබේ. පානීය නල මාර්ගය එම ප්‍රදේශය තුල එලීම සඳහා සංවර්ධන කටයුතු නතර කර තිබෙන බැවින් නළ එලීම සිදුකල පසු ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන මත මාර්ගය යථා තත්ත්වයට පත් කරලීමටත් ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:3**
අඩිපාරක්ව පැවැතුනු මාලිම්බඩ ඉන්ද්‍රාරාම මාරගහහේන මාර්ගයේ දකුණු පස මාර්ගය මේ වන විට අඩි 08 දක්වා පුළුල් කර කැටගල් ඇතිරීම සිදුකරගෙන යනු ලැබේ. පානීය නල මාර්ගය එම ප්‍රදේශය තුල එලීම සඳහා සංවර්ධන කටයුතු නතර කර තිබෙන බැවින් නළ එලීම සිදුකල පසු ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන මත මාර්ගය යථා තත්ත්වයට පත් කරලීමටත් තීරණය විය.

**යෝජනා අංක 6:4**
අමිල් උෂාන්ත මහතාගේ වැටුප බැකෝ ඔපරේටර් තනතුරේ වැටුප ලබා දීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් නාදකන්ද මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:4**
අමිල් උෂාන්ත මහතාට බැකෝ ඔපරේටර් තනතුරේ වැටුප දිස්ත්‍රික් මිල ගණන් කමිටු වාර්තාවට අනුව දිනකට රු.2000.00ක මුදල ලබා දීමට තීරණය විය.

**යෝජනා අංක 6:5**
PF- 7353 කැබ් රථය ජනවාර 27 වන දින සිට ක්‍රියාවිරහිතව පවතින බැවින් අත්‍යාවශ්‍ය කටයුතු සඳහා කුලී පදනම මත වාහනයක් මිලට ගැනීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:5**
PF- 7353 කැබ් රථය ජනවාර 27 වන දින සිට ක්‍රියාවිරහිතව පවතින බැවින් අත්‍යාවශ්‍ය කටයුතු සඳහා කුලී පදනම මත වාහනයක් මිලට ගැනීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:6</u>**

කෞශලා හිමාෂා මෙනවියට සතියට දින 5ක් සඳහාම දීමනාව ගෙවීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී සාගර එදිරිසූරිය මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:6</u>**

කෞශලා හිමාෂා මෙනවියට සතියට දින 5ක් සඳහාම දීමනාව ගෙවීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:7</u>**

මන්ත්‍රීවරුනට ලබාදෙන රු. 3000.00ක ඉන්ධන දීමනාව රු. 5000.00ක් දක්වා වැඩි කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:7</u>**

මන්ත්‍රීවරුනට ලබාදෙන රු. 3000.00ක ඉන්ධන දීමනාව රු. 5000.00ක් දක්වා වැඩි කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:8</u>**

ඇල්ගිරිය කොට්ඨාශයේ පහත සඳහන් පාරවල් පස් දමා සංවර්ධනය කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

1. ඇල්ගිරිය වාසනා ස්ටෝර්ස් අසල සිට පහල පිටිවිලහේන මාර්ගය
2. ඇල්ගිරිය පහල කියාඩුව යහලවත්ත අසල සිට නුගේවත්ත දක්වා මාර්ගය
3. ඇල්ගිරිය පන්සල අසල සිට වාඩියමුල්ල දක්වා මාර්ගය
4. හොරගොඩ නැගෙනහිර පාතේගම පන්සල පාර පන්සල අසල සිට අඹගහගොඩ දක්වා මාර්ගය

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:8</u>**

ඇල්ගිරිය කොට්ඨාශයේ පහත සඳහන් පාරවල් පස් දමා සංවර්ධනය කිරීමට තීරණය විය.

1. ඇල්ගිරිය වාසනා ස්ටෝර්ස් අසල සිට පහල පිටිවිලහේන මාර්ගය
2. ඇල්ගිරිය පහල කියාඩුව යහලවත්ත අසල සිට නුගේවත්ත දක්වා මාර්ගය
3. ඇල්ගිරිය පන්සල අසල සිට වාඩියමුල්ල දක්වා මාර්ගය
4. හොරගොඩ නැගෙනහිර පාතේගම පන්සල පාර පන්සල අසල සිට අඹගහගොඩ දක්වා මාර්ගය

**<u>යෝජනා අංක 6:9</u>**

අංක 402 බී, ගල්පමුණ ග්‍රාමසේවක වසමේ පිහිටි කුරුප්පුගේවත්ත ඉඩමේ ප්‍රවේශ මාර්ගය ඩී.ඊ.කුලතුංග මාවත ලෙස නම් කිරීමට ගරු සභාවට යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් නාදකන්ද මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:9</u>**

අංක 402 බී, ගල්පමුණ ග්‍රාමසේවක වසමේ පිහිටි කුරුප්පුගේවත්ත ඉඩමේ ප්‍රවේශ මාර්ගය ඩී.ඊ.කුලතුංග මාවත ලෙස නම් කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:10</u>**

2022 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ ලැයිස්තුව සභාගත කිරීමටත්, එය අනුමත කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

**<u>තීරණ අංක 6:10</u>**

2022 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ ලැයිස්තුව සභාගත කිරීමටත් එය අනුමත කිරීමටත් තීරණය විය.

**7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

- 2021 දෙසැම්බර් මාසය සඳහා ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශනය සභාව අනුමත කරන ලදී.

**9). වෙනත් කරුණු.**

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

තෙලිජ්ජවිල පුවක් දොළ ඉදිකිරීමට නියමිත ආදාහනාගාරයට විරෝධතා ලියුමක් එවල තියෙනවා.මේ එවපු කාරණා සියල්ල බිඳෙන කාරණා තියෙන්නෙ.ආදාහනාගාරයක් ලංකාවේ කොතන හදන්න ගියත් විරෝධතා එනවා.

<u>ගරු මන්ත්‍රී ජී.පී උදයශාන්ත මහතා</u>

ශ්‍රී වර්ධනාරාමයේ පැවති දේව මංගල්‍යය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව මගින් කම්කරුවො ටික ලබා දුන්නා.ඒ වගේම කොඩිකණු සියල්ලක්ම ලබා දීල අපිට දක්වපු සහයෝගයටත්, අපේ මන්ත්‍රීතුමිය පමණයි සහභාගි වුණේ සහභාගීත්වයටත් මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

අසනීප තත්වය මත මට සහභාගීවෙන්න බැරි වුණා.

**ගරු මන්ත්‍රී සාගර එදිරිසූරිය මහතා**

පැරණි ගම්සභා ක්‍රීඩාංගණයට මුදල් ප්‍රතිපාදන ලබා දීල තිබුණා.ඒකෙ ශක්‍යතා වාර්තාවක් කරන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඇවිත් තිබුණා. නමුත් එතන නිලධාරියෙක් මට දුරකථන ඇමතුමක් ලබාදීල කිව්වා ඒ ඉඩමේ හතර මායිම පිළිබඳව එයාලට නිශ්චිත දැනුමක් නෑ කියලා. ඒ කාර්යය ඉටු කරන්න නම් අපේ ඉඩමේ හතර මායිම් ලකුණු කරල දෙන්න කියලා.ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා ඒක ඉක්මනින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දෙන්න කියලා.

ඊට අමතරව කැරන්තොල්ල හින්නක්කමුල්ල ඉඩම පිළිබඳව මම කීප අවස්ථාවකදීම කරුණු වගයක් ඉදිරිපත් කළා. නමුත් මේ වනතෙක් ඒ ඉඩමට බැනර් එකක් දාගන්න අපට බැරිවෙලා තියෙනවා.ගොඩක් අය කිව්වා මේ ඉඩම ඉදිරියේදි වෙන්දේසි කරන්න ඉන්නවා මේක දැනුවත් කරලත් මන්ත්‍රීවරු තාම බැනර් එකක්වත් දාන්න කටයුතු කළේ නැහැයි කියලා. මං ඒ ගැන කණගාටු වෙනවා. අපිට මාසයක් වෙලත් ඒ සම්බන්ධව ක්‍රියාකරන්න නොහැකිවීම පිළිබඳව.ඒ ගැන සභාපතිතුමාගේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

මන්ත්‍රීතුමා මං ඕක බලන්න ගියා. UD එකට ඉඩම භාරදීල තියෙනවා. ඒක රහසිගතව කරන්නෙ. අපි බැනර් එකක් දාමු.

**ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා**

සභාපතිතුමා සභාවේ ජේ සී බී එක දාලා හින්නක්කමුල්ල ඉඩමේ පාරවල් කපනවා. ඉතින් සභාවේ මුදල් කොහොමද මෙහෙම වියදම් කරන්නෙ. මේ බොරු වැඩක් කරන්නෙ. මේ වෙන්දේසි කරන ඉඩමෙ සභා මුදලින් පාරවල් කපනවා වෙන්දේසිකාරයොන්ට සහයෝගයක් වශයෙන්. අපි දන්නෑ මේ මොනවද වෙන්නෙ කියලා. අපි කියන්නෙ සභාව කරන දේවල් නිවැරදිව කරමු කියල. යූ ඩී ඒරියා එකේ නෙමෙයි සභා සීමාවේ මේ ඉඩම තියෙන්නෙ. සභාවට බලය තියෙන්නෙ. යූඩී එකට භාර දුන්නලු. කොහෙමෙද එහෙම කරන්නෙ. මීට කලිනුත් මේ ඉඩමෙන් වෙන්දේසි කරල සභාවෙ කොටස දුන්නෑ. අපි වෙන කොහේදිවත් දැක්කෙ නැනෙ වෙන්දේසි ඉඩමක සභාවෙන් පාරවල් කපනව. නීත්‍යානුකූලව කරන් නැත්නම් අපට අනුමැතියක් නොදී ඉන්න පුළුවන්. ඒක නිසා වෙන්දේසියක් කරන කොට පාර කපල,කාණු කපල, කොන්ක්‍රීට් හෝ තාර දාල ඒ වැඩටික කරන්න ඕන. මේ එක එක තැනට එක එක නීති ගේන එක අපිට ප්‍රශ්නයක්.

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

හින්නක්කමුල්ල මාර්ගය සංවර්ධනය කිරීම කලේ සාගර මන්ත්‍රීතුමා දැනුවත්ව. ගමේ අය ඉල්ලීමක් කළා මේ පාර හදල දෙන්න කියලා. ඒක කරේ ගමේ මිනිසුන්ගෙ ඉල්ලීමට. එයාල කිව්ව පාරෙ යන්න බැරි නිසා පාර හදල දෙන්න කියලා. මෙම ඉඩමේ කැබලි සැලැස්මක් අවුරුදු දෙකකට පෙර සභාවට භාරදී තිබුණා. අපි එය අනුමත කලේ නෑ. අපෙන් අලුතින් ඉල්ලීමක් කලෙත් නැහැ. ඉඩම කැබලි කරනවද කියලා අපව දැනුවත් කරලත් නැහැ. සභාව දැනුවත් නොකර ඉඩම කැබලි කරලා විකුණන්න යනව නම් බැනර් එකක් ප්‍රදර්ශනය කරමු සභා අනුමැතියක් නෑ කියලා.

**ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා**

අපේ සාගර මන්ත්‍රීතුමා කථා කළා පැරණි ගම්සභා කාර්යාලයේ ක්‍රීඩාපිටියක් හැදීම ගැන. ඇත්තටම ක්‍රීඩා පිටියක් හැදීම ඉතාම වැදගත්. වසර තුනකට ඉස්සර ගරු මුදල් අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා ලක්ෂ 150 ක මුදලක් ඕකට වෙන්කළා. ඒ වෙලාවෙ මම ඉඩම් එකට ගියා. එතකොට ප්‍රාදේශීය ලේකම් එකට මේ ඉඩම් අයිතිය ගැන කිව්වම ඒ ගොල්ල ඒක භාර දුන්නා අකුරැස්සට. එයාල ඇවිත් බැලුවා.වට මැනීමකුත් කරා.ඒ නිසා සභාපතිතුමා මේක ඉක්මන්

කරල මායිම් දාල ඒ සංවර්ධන වැඩේ පටන් ගන්න. නැත්නම් මේ පාරත් මුදල් ටික ගියොත් ඒ අවස්ථාව නැතිවේවි. රජයේ ඉඩමක්නෙ. රජයේ මිනින්දෝරුවො හරහා ඒ කාර්යය කරන්න පුළුවන්. ඒ නිසා ඒ කාර්යය කඩිනමින් කරන්න කියල ඉල්ලනවා.

**<u>ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා</u>**

සභාපතිතුමනි මම මේ කතා කරන්නෙ ජන ජීවිතයට ලොකු තර්ජනයක් වෙච්ච කාරණයක් ගැන. මම ගිය සභා වාරයේදිත් ඒක කතා කළා. ඒ වහින දවස්වල තිබුණ අර්බුදයක්. නමුත් දැන් මේ පායන දවස්වල කද්දුව ප්‍රධාන මාර්ගයේ සිට මුත්තෙට්ටුමුල්ල දක්වා ප්‍රදේශයේ ඉන්න ජනතාවට දූවිලි වැදිල ලෙඩ වෙලා තියෙනවා. ඇත්තටම අපේ රටේ අතුරු මාර්ග ඔක්කොම හදනවා, ඒ වුණාට ප්‍රධාන මාර්ග ටික හදන්නෙ නැතිව. ඔය කද්දුව හන්දියේ සිට මුත්තෙට්ටුමුල්ල මාර්ගය දක්වා තිබෙන කඩ,නිවෙස් ඇතුළෙ තිබෙන භාණ්ඩ වලට දූවිලි වැදිල මහ විනාශයක් වෙලා තියෙනවා. අපිට පාරෙ බැහැල යන්න බෑ මිනිස්සු දොස් කියනවා. ගරු සභාපතිතුමාගෙන් බැගෑපත්ව ඉල්ලනවා මේක හදල දෙන්න කියලා.

ඒවගේම මගේ පියාණන්ගේ තුන්මාසෙ දානෙට සභාපතිතුමා, මන්ත්‍රීවරු වගේම සේවක මහත්ම මහත්මීන් පැමිණීම සම්බන්ධව මගේ ස්තූතිය පුද කරනවා.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

නල පද්ධතිය එලීම නිසා කොන්ත්‍රාත් කාරයො වැඩේ නවත්තල. මම ඉල්ලීමක් කළා අර්බුදයට පත්ව තිබෙන කොටස පමණක්වත් හදල දෙන්න කියලා. ඒ ටික හදල දේවි. නැතිනම් වතුර ඉසීම කරලා දේවි.

**<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>**

අකුරුගොඩ මාර්ගයේ නල එලීම සඳහා වලවල් කපලා ගොඩ කරලා නෑ. අනාරක්ෂිතයි වාහන ඉස්සර කරන්න බැරුව දෙගොල්ලො රණ්ඩු වෙනවා. සභාපතිතුමනි, මේ වැඩ ඉක්මනින් ඉවර කරන්න කියලා ජල සම්පාදන මණ්ඩලයට දන්වන්න.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

විපක්ෂ නායකතුමා කියන කතාව ඇත්ත. විවිධ බාධක නිසා සංවර්ධන කටයුතු අඩාල වෙලා තියෙනවා. මම මේ බව දන්වන්නම්. මේ විදියටම තිබුණු වෙනිඅකුළ කිරිමැටිමුල්ල මාර්ගය පෙර තත්ත්වයට පත්කලා. වේල්ල අසල පටු කොටස පුළුල් කරලා නල එලීම ආරම්භ කරනවා. ජල සම්පාදන මණ්ඩලය සමඟ ඇති කරගත් ගිවිසුම මත කටුවන්ගොඩ ප්‍රධාන මාර්ගය කාපට් කරන්න අනුමත කලා. ඉදිරියේදී පටන් ගන්නවා.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.30 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව